Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

| ශ්‍රේණිය - 10 | විෂය - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | සතිය - අගෝස්තු 01 සතිය |
|---|---|---|

01. පහත දැක්වෙන සිද්ධි ඇසුරෙන් ප්‍රශ්න වලිට පිළිතුරු සපයන්න.

අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් අධ්‍යාපන ඒකකය මෙහෙයවන ළදරු හා ළමා ඇඳුම් මැසීමේ පාඨමාලාවක් සාර්ථකව හැදෑරූ ජයනි 2020-01-01 දින තම නිවසේ කොටසක ළමා ඇඳුම් මසා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළාය.

ජනවාරි 01 දින ඇයගේ පියා ඇය නමින් බැංකුවේ තැන්පත් කර තිබූ රු. 100 000/= ක මුදල ලබාගෙන ව්‍යාපාරයට යෙදවූ අතර "සඳරු විලාසිතා" නමින් ව්‍යාපාරය නම් කළා ය. ජනවාරි 2 දින එකක් රු. 40000/= බැගින් පාවිච්චි කරන ලද ඇඳුම් මැසීමේ මැෂින් දෙකක් මිලදී ගත් ඇය ජනවාරි 5 දින "සණස" බැංකුවෙන් රු. 50 000/= ක ණය මුදලක් ද ලබා ගත්තා ය. ජනවාරි මාසයේ විදුලි බිල ලෙස රු. 8 000/= ක් දැරීමට සිදු වූ අතර ඇඳුම් මැසීමට අවශ්‍ය රෙදි සහ අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීමට රු. 60 000/= ක් වැය කිරීමට සිදු විය.

ප්‍රසිද්ධ පෙර පාසලක් ආසන්නයේ තම නිවස ඇති නිසා ඉල්ලුම වැඩි වූ අතර ජනවාරි මාසයේ දී ඇඳුම් අලෙවි කර රු. 110 000/= ක මුදලක් ලබා ගත්තා ය.

1. මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධානයකට අයත් වේද ?
2. ජනනිගේ ව්‍යාපාරය සපුරාගනු ලබන මූලික අවශ්‍යතාවය හා වුවමනාව දක්වන්න.
3. "සඳරු විලාසිතා නිවස ලියාපදිංචි කළ යුතුය." මෙම කියමනට ඔබ එකඟ වන්නේද ? නැත්ද ? යන්න දක්වා ඊට හේතුව දක්වන්න.
4. මෙම ව්‍යාපාරය තුළින් හඳුනාගත හැකි ශක්තීන් දෙකක් දක්වන්න.

5. ඉහත සිද්ධිය තුළ දැක්වෙන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර දෙක දක්වන්න. (මෙම ව්‍යාපාරය හැර)
6. ජනවාරි 01, 02 සහ 05 දිනවල සිදු වූ ගණුදෙනුවල බලපෑම් ගිණුම්කරණ සමීකරණය තුළින් දක්වන්න.
7. විදුලි ගාස්තු මුදලින් ගෙවීමට අදාළ ද්විත්ව සටහන දක්වන්න.
8. මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වගකීම් කොපමණද ?
9. 2020-01-01 දින මෙම ව්‍යාපාරයේ ප්‍රාග්ධනය යෙදීමට අදාළ ද්විත්ව සටහන දක්වන්න.
10. ඉහත ව්‍යාපාරයේ ජනවාරි මාසයේ ආදායම හා වියදම වෙන වෙනම දක්වන්න.